# Embassy of Japan

No. 20, Gregory's Road, Colombo 7, Sri Lanka
TEL:94-11-269-3831~3, FAX : 94-11-269-8629
E-mail : cultujpn@co.mofa.go.jp / www.lk.emb-japan.go.jp

## PRESS RELEASE

**2011 ඔක්තොම්බර් 27**

## උතුරේ ගම්මාන වල යුධ ගැටුම් වලින් පීඩාවිදි ජනතාව සමාජ ගත කිරීමට සහ සහජීවනය නැංවීමට ජපාන රජයෙන් ආධාර

ජපාන රජය විසින් යුද්ධයෙන් පීඩාවට පත් ගම්මාන වල ජනයා අතර සුහදත්වය වර්ධනය කිරීම හා සහජීවනය නංවාලීම සඳහා ජපාන යෙන් මිලියන 122 ක මුදලක් (ඇමරිකානු ඩොලර් 1.5  පමණ) සංක්‍රමණිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IOM) හරහා ප්‍රදානය කිරීමට තීරණය කර ඇත. මෙම ප්‍රදානය කරන මුදල මගින් පුනරුත්ථාපනය කරන ලද අභ්‍යාසලාභීන් හා යුද්ධයට මැදිව පීඩාවට පත්ව සිටි පිරිස් සමාජගත කිරීමේ හා ඔවුන් අතර සහජීවනය නංවාලීමේ ප්‍රජා මූලික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මෙම ප්‍රදානයට අදාල ගිවිසුම් අත්සන්  කිරීම අද දින ජපාන තානාපති නොබුහිතෝ හොබෝ මහතාගේ හා සංක්‍රමණිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ ශ්‍රී ලංකා ප්‍රධානී රිචඩ් ඩැන්සිගර් මහතාගේ ප්‍රධානත්වයෙන් ජපාන තානාපති කාර්යාල පරිශ්‍රයේදී සිදුවිය. මෙම ආධාර මුදල් සමාජ හා ආර්ථික සහජීවනය නංවාලීමේ ප්‍රයත්නයට ඵලදායී ලෙස යොදා ගනු ඇතැයි ජපාන රජය බලාපොරොත්තු වන බව එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ නොබෝ මහතා ප්‍රකාශ කළේය.

උතුරු පලාත සඳහා සැපයූ ජපාන ආධාර සංවර්ධන කටයුතු පුළුල් කිරීම, මානුෂික අවශ්‍යතා අඛණ්ඩව සපුරාලීම ඇතුළුව විවිධාකාර අංශයන්  සඳහා මෙතෙක් යොදාගෙන ඇත. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින උතුරු පලාතේ ජපාන ව්‍යාපෘති අතර යාපනය ශික්ෂණ රෝහලේ මූලිකාංග වැඩිදියුණු කිරීම, වව්නියා කිළිනොච්චි විදුලි සම්ප්‍රේෂණ පද්ධතිය ඉදිකිරීම, බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා ආධාර සැපයීම මෙන්ම යාපනය මන්නාරම දිස්ත්‍රික්ක වල සංවර්ධන සැලසුම්කරණය සහ ජීවනෝපායන් ගොඩනැගීම සඳහා ආධාර ලබාදීම ආදිය මුල්තැනක් ගනී. මෙම ව්‍යාපෘතීන් මඟින් උතුරු පලාතේ සහ ඒ අවට ජනතාවට සුභසිද්ධිය සැලසෙන අතරම ඔවුන්ගේ ජීවනෝපායන් වැඩි දියුණු වනු ඇතැයි ජපන් රජය බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා රජය මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව හා රාජ්‍ය නොවන සංවිධානයන්හි සහයෝගයෙන් උතුරු නැගෙනහිර පලාත් නැවත ප්‍රකෘති තත්වයට පත්කිරීමට හා සංවර්ධනය කිරීමට ජපාන තානාපති කාර්යාලයේ සහයෝගය නිරතුරුව හා උපරිම අයුරින් ලබාදීමට බලාපොරොත්තු වේ.

************************************************************

Please contact the Economic Cooperation Section for further information.

Tel: 011-269-3831~3 (ext.227)